**මාතලේ මහා නගර සභාව - 2023**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාතලේ මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මාතලේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ රු 1,730,000.ලෙස ගිණුම්ගත කර තිබු වාහන ක 02වටිනාකම සමාලෝචිත වර්ෂයේදී රු 1,300,000.ක් ලෙස රු 430,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරුවක් ලබාගෙන නිවැරදිව ගිණුම්වලට ගැලපීම් සිදුකරන බව. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | දුම්රිය ගබඩාව පරිහරණය කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා දුම්රිය සේවයට රු.421,935 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | හිඟ මුදල ණයහිමි ලෙස හඳුනාගෙන ගෙවීම් සඳහා ඉදිරියේදී කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | ඉකුත් වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 08 කදි ගෙවන ලද එකතුව රු.567,308 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලිවල තීන්ත ආලේප කීරිම සඳහා වැය කල එකතුව රු.433,393ක් ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති 05 ක ඉදිකිරීම් හා අලුත්වැඩියා සඳහා වැය කරන ලද එකතුව රු.5,012,184 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලා‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් උප ලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු.307,509ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී පරික්ෂා කර නොසැසඳීම් නිවැරදි කරගන්නා බව. | ගිණුම් ශේෂ නිවැරදි කළයුතුය. |

**1.6.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ අයකිරීමට ඇති වැඩ යටතේ දක්වා ඇති රු.545,237 ක තොග අතිරික්තය නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි . | මෙම ශේෂය පිළිබඳ වැඩිදුරටත් සොයා බලා ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | **පාර්ලිමේන්තු පනත්** | | | |
| | 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | ආයතන 50 ක නාමපුවරු 102 ක් සඳහා දැන්වීම් පුවරු ගාස්තු ලෙස රු. 615,780 ක් අයකර නොතිබුණි. | නොගෙවන ආයතනය සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීටම කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| **(ආ)** | **මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය)** | | | |
| | 247(අ) වගන්තිය | නියැදි පරීක්ෂණයේදී හඳුනාගන්නා ලද බල ප්‍රදේශයේ ව්‍යාපාර ආයතන 13 ක් සඳහා රු.52,000 ක වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | 2023 වර්ෂයට අයත් බලපත්‍ර ගාස්තු මිශ්‍ර ආදායම යටතේ අය කර ගැනීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

**(ඇ) වෙනත් චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008 (vi) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අනුමත ඉන්ධන ඩීසල් ලීටර් 135 කට අදාලව ඉන්ධන දීමනාව වැටුපට එකතු කර ලබාදි තිබියදී එම ප්‍රමාණය ඉක්මවා 2021 ජූනි සිට 2023 ඔක්තෝබර් දක්වා කාලය තුල අනුමැතියකින් තොරව නාගරික කොමසාරිස්ගේ ගමන් වෙනුවෙන් ඉන්ධන ලීටර් 4120 ක් සඳහා රු.1,042,721 ක මුදලක් ලබාගෙන තිබුණි. | මහා නගර සභා ආඥා පනත ප්‍රකාරව මෙම ඉන්ධන ලබා ගැනීම සිදු කරන ලද බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 111,343,407 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 79,574,869 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (I) | වරිපනම් බදු | 40,443,000 | 46,133,318 | 50,028,929 | 40,232,804 | 38,200,000 | 43,631,653 | 46,554,974 | 44,128,415 |
| (II) | කඩ කුලී | 18,987,000 | 20,246,271 | 22,340,654 | 5,499,477 | 27,062,000 | 17,461,605 | 17,455,157 | 7,593,860 |
| (III) | බලපත්‍ර ගාස්තු | 11,000,000 | 9,510,128 | 9,735,769 | 755,000 | 15,401,000 | 12,573,547 | 11,793,096 | 980,641 |
| (IV) | වෙනත් ආදායම් | 42,857,349 | 28,808,785 | 20,278,375 | 20,745,836 | 42,857,349 | 36,747,609 | 33,863,113 | 12,215,426 |
| | එකතුව | 113,287,349 | 104,698,502 | 102,383,727 | 67,233,117 | 123,520,349 | 110,414,414 | 109,666,340 | 64,918,342 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම්** | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.40,232,804 ක හිඟ වරිපනම් ශේෂයක් පැවති අතර ඉන් එක් ඒකකයකින් රු.50,000 කට වඩා වැඩි දේපල 38 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.14,795,541 ක හිඟ ශේෂයක් මහා නගර සභා අඥාපනතේ (252 අධිකාරය) 251 වගන්තිය ප්‍රකාරව කටයුතු කර අයකරගෙන නොතිබුණි. මේ තුල රජයේ දේපල 17 කින් අයවිය යුතු හිඟ හිටි වරිපණම් ශේෂය රු.3,632,354 ක් වන අතර, පෞද්ගලික දේපල 21 කින් අයවිය යුතු හිඟ හිටි වරිපනම් ශේෂය රු.11,163,187ක් විය. | දේපල හිමියන් වෙත රතු නිවේදන මඟින් වරෙන්තු නිකුත් කර ඇති අතර දේපල තහනම් කර ඉදිරි නීතිමය කටයුතු සිදුකරමින් පවතින බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| **(ආ)** | **ජල ගාස්තු** | | |
| | වසර 19 ක පමණ කාලයක සිට හිඟ හිටි රු.4,802,812 ක ජල ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | ලිපි අදාල ආයතනයට යවා ඇති නමුත් මේ වන විටත් විසඳුමක් ලැබී නොමැති බව. | හිඟ ජල ගාස්තු අයකර ගැනීම කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **හිඟහිටි එක්වන් මුදල** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.10,909,189 ක කඩකුලී එක්වන් මුදලක් අයකර නොතිබුණි. | ඉදිරියේදී මෙම හිගය අය කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | හිගය අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පනවා ඇති කාර්යයන් ඉටුකිරීම

මහා නගර සභා පනතේ 04 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කසළ බැහැර කිරීම, පරිසරයට අවම හානියක් වන අයුරින් පවත්වාගෙන යාමේ හැකියාවක් පවතීද යන්න පිළිබවඳව පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමකින් හා පරිසර බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව මහා නගර සභාව විසින් වාරියපොල වත්ත ඉඩමට කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් අසළ පදිංචිකරුවන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනුකිරීම හේතුවෙන් 2008 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා නීතිඥ ගාස්තු වශයෙන් එකතුව රු.6,176,475 ක මුදලක් සභා අරමුදලින් ගෙවීමට සිදුව තිබුණි. | දැනට පරිසර හානියක් සිදු නොවන බැවින් මෙම නඩුව අවසන් වී ඇත. මෙම නඩු තීන්දුව මෙතෙක් ලැබී නොමැති අතර , එය ලැබීමෙන් පසු දැන්වීමට කටයුතු කරන බව. | ව්‍යාපෘති ඉටු කිරීමට පෙර අදාල ආයතන වලින් අවශ්‍ය නිර්දේශ ලබා ගතයුතුය. |

## 3.2 දෘෂ්‍ය අක්‍රමිකතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2256 දරන ගැසට් පත්‍රයෙහි පලකර තිබූ ගාස්තු අයකිරීමට අනුව සුසාන භූමියේ 6' x 4' ප්‍රමාණයේ ස්මාරකයක් අළුත්වැඩියාව සඳහා රු.30,000 ක් අයකළ යුතු බව දක්වා තිබුණ ද 2022 දෙසැම්බර් 15 දිනැති අංක 93603 හා 2023 මාර්තු 16 දින අංක 97405 දරන ලදුපත් මඟින් පිළිවෙලින් ඒ සඳහා රු.20,000 ක් හා රු.10,000 ක් අයකර තිබීම හේතුවෙන් රු.30,000 කින් සභා අරමුදලට පාඩුවක් සිදුකර තිබුණි. | මෙම පාඩු වූ මුදල නැවත අයදුම්කරුගෙන් ලබා ගැනීමට කටයුතු කරන බව. | විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කළයුතුයි . |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා මිහිදන් කර තිබූ මෘත දේහ 07 ක් වෙනුවෙන් ලැබියයුතු රු.70,000 ක මුදලක් නගර සභා ආදායමට බැර නොකර අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කර අදාළ ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව. | කඩිනමින් විමර්ශන කටයුතු සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ ඔක්තෝබර් 01 දින සිට සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 30 දක්වා කාල සීමාවට අදාලව මහා නගර සභා ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීමේදී ආදාහනාගාර ගාස්තු ලෙස නිලධාරීන් විසින් අයකර තිබූ මුදල් සඳහා වෙනත් ආදායම් ලැබීම් වලට අදාල ලේඛන ව්‍යාජ ලෙස දක්වා, ලදුපත් වෙනස් කිරීම, අදාල බලපත්‍රයේ සටහන් වෙනස් කිරීම, මුදල් ලබාගෙන ලදුපත් නිකුත් නොකිරීම යනාදී වශයෙන් ලේඛන වෙනස් කර එකතු කරන ලද මුදල් රු.620,000 ක ආදායමට බැර නොකර අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි. | මු.රෙ. 104 (4) පරීක්ෂණයට අනුව මුදල් අයකර ගැනීමට ලිපි යොමුකර ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ගලි සේවා 57 ක් ලබාදිම වෙනුවෙන් අයකල මුදල් සඳහා සේවා ලබාගැනීමේ අයදුම් පතේ වෙනත් ආදායම් වෙනුවෙන් නිකුත් කල කුවිතාන්සි අංක ව්‍යාජ ලෙස යොදා ගලි සේවා සඳහා අයකල රු.365,125 ක්, අංක 97403 දරන ලදුපතින් අයකල රු.14,250 ක් වෙනුවට රු.6,900 ක් ආදායමට බැර කර රු.7,900 ක්ද අංක 96251 දරන ලදුපතින් රු.6,900 ක් ලබාගෙන තිබුණද එහි දෙවන හා තෙවන පිටපත් අවලංගු කල බව දක්වා ආදායමට නොගෙන හා අදාල ගලි සේවා ලබාගෙන අදාල අයදුම් පතේ ලදු පත් අංක සඳහන් නොකර රු.113,275 ක් සහා අරමුදලට බැර නොකිරීම ඇතුලුව එකතුව රු.493,200 ක අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි. | මේ සම්බන්ධයෙන් මහා නගර සභාව මගින් මූලික විමර්ශනයක් ආරම්භ කර කටයුතු සිදු කරමින් පවතින බව. | -එම- |
| (ඉ) | ගෑස් සැපයුම්කාර ආයතනයකින් වෙනත් ආයතනයකට නිකුත් කල ඉන්වොයිස් පතක් ලබාගෙන එම ඉන්වොයිස් පතේ වටිනාකම රු.92,675 ක් ලෙස වෙනස් කර 2022 දෙසැම්බර් 19 දින 2439 දරන වවුචරයට අමුණා ව්‍යාජ ලෙස ගෑස් ලබා ගැනීමකින් තොරව අත්තිකාරම් පියවා රු.92,675 ක අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කර අදාළ ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව. | -එම-. |
| (ඊ) | ආදාහනාගාරයේ පවත්වාගෙන යමින් තිබූ දෛනික ගෑස් ලැබීම් සටහන් කරන ලද කාඩ්පතට අනුව 2022 ජනවාරි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කිලෝ ග්‍රෑම් 37.5 ගෑස් සිලින්ඩර් 330 ක් ලබාගෙන තිබුණද, මහා නගර සභාවේ ගෑස් මිලදී ගැනීම් සඳහා වූ ගෙවීම් වවුචර් අනුව 349 ක් මිලදී ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව රු. 285,741 ක් වූ කිලෝ ග්‍රෑම් 37.5 ගෑස් සිලින්ඩර් 19 ක් ආදාහනාගාරයට ලැබී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කර අදාළ ක්‍රියා මාර්ග ගැනීම සඳහා කටයුතු කරනු ලබනු බව. | කඩිනමින් විමර්ශන කටයුතු සිදුකර අහිමි වූ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය . |
| | එසේම ආදාහනාගාරයේ රු.35,000 ක ගෑස් සිලින්ඩරයක ඌනතාවයක් පැවතුණි. | තවදුරටත් ගෑස් සිලින්ඩරය භාර දිමට කටයුතු නොකරන්නේ නම් නීතිමය වශයෙන් ඉදිරියට පියවර ගැනිමට කටයුතු කරනු ලබන බව. | ඌනතාවය පියවා ගැනීමට කටයුතු කළයුතුය. |

### 3.3 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපලපිරියත හා උපකරණ ,

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පූර්ව ශක්‍යතා අධ්‍යයනයකින් හා පරිසර බලපත්‍ර ලබා ගැනීමකින් තොරව කසළ බැහැර කිරීමට 2010 ඔක්තෝබර් 03 දින රු.2,000,000 ක් ගෙවීම් කර ලබාගෙන තිබුණු අක්කර 5 ක වෙරගම විහාරගම වත්ත ඉඩම අරමුණුගත කාර්යට යොදවා ගැනීමට නොහැකිව නිශ්කාර්යව පැවතුණි. | මෙම ඉඩම පුරා පැතිරී ගිය ස්ඵටික හුණුගල් නිරීක්ෂණය වී ඇති බැවින් වෙනත් ව්‍යාපෘතියක් සඳහා යොදවා ගැනීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. | ව්‍යාපෘති ඉටු කිරීමට පෙර පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතුය. |

### 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 09 ක එකතුව රු.77,397,241 ක් වූ අතර , ඉන් අය නොකර පවතින කාලය වසර 1 ට වැඩි හා 5 ට අඩු ශේෂය රු.33,044,383 ක් හා වසර 5 ට වැඩි ශේෂය රු. 22,786,810 ක් අයකර ගෙන නොතිබුණි. | මුදල් අය කරගැනීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | ලැබියයුතු ගිණුම් ශේෂ අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු විවිධ ණයහිමි ශේෂය රු. 105,745,130 ක් පැවැති අතර, ඉන් නිරවුල් නොකර පවතින කාලය වසර 1 ත් වසර 5 ත් අතර ශේෂය රු.2,265,905 ක් හා වසර 5 ට නැඩි ශේෂය රු.71,182,486 ක් නිරවුල් කර නොතිබුණි. | දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන ශේෂ ඉදිරියේදී ඒ සඳහා කමිටුවක් පත්කර එම කමිටු වාර්තා මහ සභාවට ඉදිරිපත් කර නිරවුල් කරන බව. | ශේෂ නිරවුල් කල යුතුය. |
| (ඇ) | මහා නගර සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම් හා ව්‍යාපෘති සඳහා ගෙවීම් කරන ලද අවස්ථා 03 කට අදාල එකතුව රු. 937,033 ක එකතු කළ අගය මත බදු (VAT), සභාව විසින් රැස්කර කරන ලද VAT ආදායමට හිලව් කර ගැනීමෙන් තොරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සභාවට ලැබියයුතුව තිබූ රු.937,033 ක මුදල ප්‍රතිපූර්ණය වී නොතිබුණි. | VAT පාලන ගිණුම මඟින් ගලපා නිවැරදි කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් අයකර ගැනීමට කටයුතු සිදුකරන බව. | විෂය භාර නිලධාරින්තම කාර්ය වගකීමෙන් යුතුය ඉටුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහා නගර සභාවට අයත් සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදු පදනම මත භාහිර පාර්ශවයන්ට ලබාදීමේදී අයකලයුතු හිඟ එක්වන් මුදල රු.452,115 ක් හා රු.4,308,287 ක දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වසර 5 කට වරක් ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නීතිමය පියවර ගැනීම සඳහා අදාළ ලිපි සකස් කර ගණකාධිකාරී නිර්දේශයට යොමු කර ඇති අතර නිර්දේශ ලද වහාම නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතුයි. |
| (ඉ) | මාතලේ මහා නගර සභාවට අයත් භූමියක පවත්වාගෙන යන ටෙනිස් ක්‍රීඩා පිටිය මාතලේ ටෙනිස් සංගමයක් ලෙස දක්වන පෞද්ගලික ආයතනයක් එහි පරිපාලන කටයුතු සිදුකර ඇතත් මේ සඳහා විධිමත් බදු ගිවිසුමක් හෝ බදු කුලී අයවන ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවුණි. වාචික එකඟතාවය මත මසකට රු.10,000 බැගින් ගෙවීමේ පොරොන්දුව මත මෙහි පාලනය සිදුකර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් තව දුරටත් අයවියයුතුව තිබූ රු. 112,000 ක හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ටෙන්ඩර් කිරීමේදී ජාතික ටෙනිස් සංගමයේ උපදෙස් ලබා ගෙන අදාල කොන්දේසි ඇතුලත් කර ටෙන්ඩර් පටිපාටිය ඉදිරියේදී ක්‍රියාත්මක කරන බව. | අහිමි වූ ආදායම් අයකර ගැනීමට හා විධිමත් පරිදි බදු දීමට කටයුතු කළයුතුය. |
| (ඊ) | අනුබෙදුමකින් මහා නගර සභාවට වෙන්කර තිබූ, මාතලේ නුවර පාර අංක 18 දරන ස්ථානයේ පිහිටා ඇති ඉඩම් කැබැල්ල භාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් භුක්ති විඳිමින් වෙනත් පාර්ශවයක් සඳහා උප බදු ලබාදී තිබුණු අතර එහි සන්තකය ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි . එසේම අදාල ඉඩමේ අයිතිය පවරාගෙන නොතිබුණි. | මෙම ඉඩම් කොටස නීත්‍යානුකූලව ඔප්පුවක් මගින් නගර සභාව වෙත පවරාගැනීමට ඉතා කඩිනමින් කටයුතු කරන බව. | කඩිනමින් අයිතිය පවරා ගැනීමට හා අනවසර පදිංචිකරුවන් ඉවත් කිරිමට කටයුතු කළයුතුය. |

**3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් ලේඛනය අනුව රු.100 බැගින් වරිපනම් අයවන ඉඩම් 56 ක් පරික්ෂා කිරීමේදී එම ඉඩම්වල ගොඩනැගිලි ඉදිකර පදිංචිය හා ව්‍යාපාර කටයුතු සඳහා යොදවා ගෙන තිබුණද ඒ අනුව, අනවසරයෙන් ඉදිකල ගොඩනැගිලිවලින් ඊට අදාල වරිපනම් ලෙස රු.510,780 ක් අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කොට්ඨාශ භාර සංවර්ධන නිලධාරි හා තාක්ෂණ නිලධාරින් මගින් එම දේපල පරීක්ෂාකර බලා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන බව. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හෝ විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අනුමත සැලැස්මකින් තොරව අනවසරයෙන් ඉදිකිරීම් සිදු කිරීම මත මාතලේ ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවහන මණ්ඩලයේ ගොඩනැඟිල්ලෙන් හා මාතලේ රජ වීදියේ අංක 91 දරන ගොඩනැඟිල්ලෙන් පිළිවෙලින් රු.96,000 ක් හා රු.50,626 ක් වශයෙන් රු.146,626 ක වරිපනම් ආදායමක් අයකර නොතිබුණු අතර, අනුකූලතා සහතික නොමැතිව පදිංචි වීම තුලින්ද පිළිවෙලින් රු.104,100 ක් හා රු.73,000 ක් වශයෙන් රු.177,100 ක මුදලක් අයකර නොතිබුණි. | එම දේපල පරීක්ෂාකර ඉදිරි කටයුතු සිදු කරන බව. | සභාවට අයවිය යුතු ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | මාතලේ පයිප්ප ලයින් පාරේ හා ඩෝරා පාරේ , ගොඩ කිරීමේ අනුමැතියකින් තොරව හා සැළසුම් අනුමත කර ගැනීමකින් තොරව , පුද්ගලයන් අනවසරයෙන් කුඹුරු ඉඩම්වල නිවාස තනා පදිංචි වී තිබුණි. | නිළධාරීන් විසින් අදාල ක්ෂේත්‍රයන් පරීක්ෂාකර ලබාදෙන ලද නිරීක්ෂනයන්ට අනුව මේ වන විට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හෝ විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පරීක්ෂාවට ලක් කෙරුණු සම්ප්‍රේෂණ කුළුණු 12 අතරින් කුළුණු ස්ථාපිත කර තිබූ නිවාස 08 කට අදාලව විධිමත් පරිදි නගර සභාවෙන් අනුමත කරගනු ලැබූ ගොඩනැගිලි සැලැස්මක් වරලත් ඉංජිනේරු සහතික සමඟ සුදුසුකම්ලත් ව්‍යුහාත්මක ඉංජිනේරුවරුන්ගෙන් ලබා ගන්නා ලද අනුමත කළ ව්‍යුහාත්මක සැලැස්මක් හෝ ගොඩනැඟිල්ල සඳහා අනුකූලතා සහතික ලබා ගැනීමක් සිදුකර නොතිබුණි. | මෙම කුළුණු ස්ථාපිත කර ඇති ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂාකර වාර්තාවක් ලබා දෙන ලෙස කොට්ඨාශ භාර සංවර්ධන නිලධාරින් වෙත ලිඛිතව දන්වා ඇති බව. | නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධිවිධාන අනුව කටයුතු කළයුතුය. |
| (ඉ) | මාතලේ එම්.සී. පාර අංක 21 දරන දේපලට අදාල වරිපනම් ලේඛන අනුව රෙදි නිශ්පාදන කර්මාන්ත ශාලාවක් පවත්වා ගෙන යන බව දක්වා පැරණි තක්සේරුවක් මත වරිපනම් අයකර තිබුණද, පරීක්ෂණ දිනය වූ 2023 නොවැම්බර් 24 වනවිට එහි අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදිකර බෞද්ධ පාසලක් පවත්වා ගෙන යන බවක් නිරීක්ෂණය වූ අතර ඉන් අනුමැතියකින් තොරව ඉදිකර තිබුණු ගොඩනැගිලි තුනක් වෙනුවෙන් රු.218,400 ක වරිපනම් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවක් ලබාගෙන තක්සේරු දෙපාර්තමේන්තුවට යවා තක්සේරු වාර්තාව ලබාගෙන වරිපනම් මුදල් අය කිරීමට කටයුතු කරන බව. | අයවියුතු ආදායම් අයකර ගැනීමට හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හෝ විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | නාගරික සංවර්ධන අධිකාරියේ අනුමත ගොඩනැඟිලි සැළසුමට පරිභාහිරව, සුපිරි වෙළඳ සංකීර්ණයේ රථ ගාල සඳහා වෙන්කර තිබූ පරිශ්‍රයේ අනවසරයෙන් කරන ලද වර්ග අඩි 468 ඉදිකිරීම සඳහා වර්ග අඩියකට රු. 5,000 ක් බැගින් රු.2,340,000 ක එක්වන් මුදලක් හා මාසික කුලියක් ලබා ගතයුතු බවට සභා අනුමැතියක් ලබාගෙන තිබුණත්, ඒ සඳහා වර්ග අඩි 264 කට රු. 5,000 ක් බැගින් රු.1,320,000 ක් පමණක් අයකර තිබීම හේතුවෙන් රු.1,020,000 ක මුදලක් සභා ආදායමට අඩුවෙන් අය කර තිබුණි . | ප්‍රධාන නාගරික ඉංජිනේරු අමතමින් අදාළ ගොඩනැගිලි සැලැස්ම සහ අදාළ තොරතුරු ලබා දෙන ලෙස දන්වා ලිපි යොමු කර ඇති බව හා එක්වන් මුදල් සහ කඩ කුලී ආදායම සභාව වෙත අය කර ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරන බව. | ආදායම් අයකර ගැනීමට හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හෝ විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 34 හා 36 දරන කඩ කාමර ඉදිරිපිට ඇති අනවසර කොටස බදුදීම මඟින් කඩ කුලී ලෙස තවදුරටත් ලැබිය යුතුව තිබූ රු.707,900 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කුලී ආදායම සභාව වෙත අය කර ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරන බව. | අයවියුතු ආදායම් අයකර ගැනීමට හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හෝ විධිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2010 ඔක්තෝබර් මසින් පසු කිසිම අවස්ථාවක මාසික කුලියේ නව තක්සේරුවක් ලබා නොගැනීම තුල පැරණි තක්සේරුව මත පදනම්ව කුලී අයකර, සභාවට ලබාගත යුතුව තිබූ රු.651,750 ක ආදායමක් අහිමි කරගෙන තිබුණි . | නව තක්සේරු වටිනාකම් පිළිබඳ වාර්තාවක් නොලැබීම හේතුවෙන් තවදුරටත් පැරණි කඩ කුලී මුදල අය කිරීමට සිදු වී ඇති බව. | වසර 5 කට වරක් නව තක්සේරුවක් ලබාගෙන කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය . |
| (එ) | සමාලෝචිත වර්ෂය සඳහා සිදුකරන ලද සමීක්ෂණයකට අනුව පවත්වාගෙන යන ව්‍යාපාර ආයතන 144 කින් කර්මාන්ත බදු, වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු වශයෙන් රු.531,000 ක ආදායමක් අයකර නොතිබුණි. | මෙම හිඟ ආදායමද මිශ්‍ර ආදායම යටතේ අය කර ගැනීමට කටයුතු සිදු කරන බව. | බලපත්‍ර නොමැතිව ව්‍යාපාර කටයුතු කරන අයවලුන් සම්බන්ධයෙන් නීති මඟින් කටයුතු කළ යුතුය. |
| | එසේම වෙළඳ බලපත්‍ර ලබා ගැනීමට අදාලව සෞඛ්‍ය නිර්දේශ ලබාදීම ප්‍රතික්ෂේප කර තිබූ ව්‍යාපාර 4 ක ව්‍යාපාර කටයුතු නැවත්වීමට හෝ වෙළඳ සැල් මුද්‍රා තැබීමට හෝ කටයුතු කර නොතිබුණි . | 2024 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු ගෙවීමට පැමිණීමේදී 2023 වසරේ මෙම හිඟ ආදායමද මිශ්‍ර ආදායම යටතේ අය කර ගැනීමට කටයුතු සිදු කරන බව. | විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කළයුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහා නගර සභාවේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 31 ක පුරප්පාඩු 117 ක්ද තනතුරු 02 ක අතිරික්තතා 09 ද පැවතුණි . | තනතුරුවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාළ ආයතන වෙත දැනුම් දී ඇති බව. | අනුමත කාර්ය මණ්ඩලය පවත්වා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | හදිසි අත්‍යාවශ්‍ය කටයුත්තක් ලෙස කරුණු දක්වා පිරිසිදු හරිත නගරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් අවශ්‍ය සෞඛ්‍ය කම්කරුවන් ලෙස සේවයට තාවකාලික පදනම මත බඳවාගත් සේවකයන් පස් දෙනෙකු, එම අරමුණෙන් බැහැරව කාර්යාලගත සේවාවන් හි යොදවා ඔවුන් වෙනත් දෙපාර්තමේන්තු යටතේ සේවා ඉටුකරමින් සිටියදී සෞඛ්‍ය වැය විෂයෙන් (21415-11) දීමනා ගෙවා තිබුණි. | මෙම සේවකයින් ඩෙංගු මර්ධන කටයුතු සඳහා යොදවන අතර හදිසි අත්‍යවශ්‍ය රාජකාරි කටයුතුවලදී පමණක් කාර්යාලය තුළ සේවය සඳහා යොදවන බව. | බඳවාගත් කාර්යයන් සඳහා කාර්යය මණ්ඩලය යෙදවිය යුතුය. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනය

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **විහාර පාර සංවර්ධනය කිරීම - 12,443,189**<br>පහත කරුණු නිරීක්ෂණය විය | | |
| (අ) | විෂය අංක 09 යටතේ , Tack Coat යෙදීම සඳහා වර්ග මීටරයකට රු.134, බැගින් වර්ග මීටර් 2041.50 ක් සඳහා රු.273,561 ක් ඇස්තමේන්තු කර තිබුණද, මෙම විෂයට භෞතිකව ඉටුකර නොතිබුණි . | Tack coat නොයෙදූ ස්ථාන නැවත සකස් කිරීමට දන්වා ඇති බව. | ඇස්තමේන්තු ප්‍රකාරව කර්මාන්ත ඉටු කළයුතුය. |
| (ආ) | මෙම ව්‍යාපෘතිය 2023 අප්‍රේල් 08 දින නිම කිරීමට ගිවිසුම්ගතව 2023 ජූනි 23 දක්වා දින දක්වා දීර්ඝ කර 2023 සැප්තැම්බර් 18 දින වැඩ අවසන් කර තිබුණි. ඒ අනුව ප්‍රමාද වූ දින 87 කට දිනකට රු.4,000 බැගින් රු.348,000 ක ප්‍රමාද ගාස්තුවක් අඩුකළ යුතු වුවත්, රු.99,546 ක් අයකිරීම හේතුවෙන් රු.248,454 ක ප්‍රමාද ගාස්තු අඩුවෙන් අයකර තිබුණි . | නියමිත දිනට වැඩ අවසන් කිරීමට නොහැකි වූ අතර ගෙවීම් කිරීමේදී රු.99545.60 ක මුදලක් දැනට ප්‍රමාද ගාස්තු ලෙස අයකර ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විෂය අංක 05 යටතේ මිලි මීටර් 37.5 ABC සැපයීම වෙනුවෙන් ඝන මීටරයක් රු.4,138 බැගින් ඝන මීටර් 237 ක් සඳහා රු.980,706 ක් ඇස්තමේන්තු කර තිබුණද, වැඩ බිමේ ABC ගොනුකර ලබාගෙන තිබුණු මිණුම් සමඟ සසඳා කරන ලද භෞතික පරීක්ෂාවේදී රු.131,754 ක් වටිනා ඝන මීටර් 31.84 ක ABC තොග ඌනතාවයක් තිබුණි. | ගෙවීම් කිරීමේදි එම ප්‍රමාණය අඩුකර ගෙවීමට කටයුතු කරන ලෙසට තාක්ෂණ නිලධාරි වෙත ලිඛිතව දැනුම් දී ඇත. | වැඩබිමට සපයන ලද ද්‍රව්‍ය සඳහා පමණක් ගෙවීම් කළයුතුය . |